# ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

"නිපුණතා පියස", 4 වන මහල, 354/2, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ 05
දුරකථන අංක 011-2596516/17, 0112-598220

දිනය - 2026.07.16

කළමනාකරු,

**<u>ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සඳහා සමරු කලාප මුද්‍රණය කර ගැනීම</u>**

2026.08.11 දින BMICH හි පැවැත්වීමට නියමිත 5 වන ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සඳහා අවශ්‍ය සමරු කලාප මුද්‍රණය කර මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ. ඔබ ආයතනයේ මුද්‍රා තබන ලද මිල ගණන් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන **2026.07.21** දින ප.ව. **2.30**ට පෙර ඉහත ලිපිනයෙහි සඳහන් ප්‍රසම්පාදන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. මිල ගණන් බහාලන කවරයේ වම් පස**"VTA/PROC/Service/TF/SM/2026/28/Souvenir (Diploma Ceremony)"** සඳහන් කළ යුතුය. ලංසු විවෘත කිරීම **2026.07.21** දින ප.ව. **2.30**ට ඔබ හෝ ඔබ විසින් නම් කරන ලද බලයලත් නියෝජිතයකු ඉදිරිපිටදී එම ස්ථානයේදීම සිදු කිරීමට සැලසුම් කර ඇත.

**<u>මිල ගණන් ඉදිරිපත් කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු</u>**

1. ඉහත මුද්‍රණ කාර්යය සඳහා අනුමත කරන ලද පරිගණක චිත්‍රක සැකසුමේ (Art Work) සඳහන් වර්ණ හා ඡායාරූප (Image) වල ගුණාත්මකභාවය සහිතව හා පිරිවිතරයන්ට අනුව මුද්‍රණ කාර්යය සිදු කල යුතුය.

2. මෙම සමරු කලාපය, ඩිප්ලෝමාලාභීන්ගේ සමරු සටහනක් වශයෙන් වසර ගණනාවක් සුරක්ෂිතව ලබා ගැනීමට හැකි වන හා පෙළඹවීම් ඇති කරවන පරිදි නිසි ප්‍රමිතියෙන් යුතු මුද්‍රණ කඩදාසි, බෝඩ් (Board) හා මුද්‍රණ තීන්ත භාවිතා කර මුද්‍රණ කාර්යය සිදු කල යුතුය.

3. මෙම මුද්‍රිත සමරු කලාපය, නියමිත දිග හා පලල අනුව කැපුම් (Cut) කල යුතුය.

4. මෙම මුද්‍රණ කාර්යය, Off Set සිව් වර්ණ (04 Color) මුද්‍රණ යන්ත්‍රයක, මුද්‍රණය කිරීම යෝග්‍ය වේ.

5. මෙම මුද්‍රණ කාර්යයට අදාලව, කළු සහ සුදු ඇතුලත පිටු (Black and White Inner pages) සඳහන් කර ඇති පිටු සංඛ්‍යාවට වඩා වැඩි වන අවස්ථාවලදී එම වැඩිවන එක් පිටුවක් සඳහා අයකරන ගාස්තුව සඳහන් කල යුතුය.

6. මෙම මුද්‍රණ කාර්යයට අදාලව, වර්ණ ඇතුලත පිටු සංඛ්‍යාව (Color Inner Pages) සඳහන් කර ඇති පිටු සංඛ්‍යාවට වඩා වැඩි වන අවස්ථා වලදී එම වැඩි වන එක් පිටුවක් සඳහා අයකරන ගාස්තුව සඳහන් කල යුතුය.

සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)

ඇමුණුම 01

| අංකය | අයිතමය | පිරිවිතර | ප්‍රමාණය | ඒකකයක වටිනාකම | බදු | මුළු වටිනාකම |
|---|---|---|---|---|---|---|
| 01 | 5 වන ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය සඳහා සමරු කලාපය | * **Inner Page**<br>- Page Size: 176 mm x 250 mm (B5)<br>- Inner Paper : Art Paper, 150 GSM (White, Gloss)<br>- No of Page : 66 - 68<br>- Page color : 04 Color – All Pages<br>* **Cover Page**<br>- Art Board : 310 GSM<br>- Page Color : Out Side – One (01) Color with Gold Foil<br>- In Side – Four (04) Color<br>- Matt Laminating (One Side)<br>* **Perfect Binding**<br>* **Book Finishing Size** : 176mm x 250mm | 900 | | | |
| | | මුළු එකතුව | | | | |

දිනය :

අත්සන සමඟ මුද්‍රාව: